125114

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2562 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018(2019) 1 S

## (01) බුද්ධ චරිතය

පැය තුනයි

2019.03.16 /08.30 - 11.40

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. (i) මහාබ්‍රහ්මයා විසින් චතුර්වර්ණය මවන ලද ස්වකීය ශරීරයේ ස්ථාන හතර ලියා දක්වන්න. (ලකුණු 04 යි)
(ii) බ්‍රාහ්මණ ධර්මයට අනුව පුද්ගල ජීවිතයේ චතුර් ආශ්‍රම ධර්ම නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) ක්ෂත්‍රිය වර්ණයට හිමි ස්වධර්ම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iv) 'චතුර් ආශ්‍රම ධර්ම බ්‍රාහ්මණ ආගමේ අධිකාරයකට වඩා සැලසුම් සහගත ජීවිතයක අවශ්‍යතාව කියා දෙන ඉගැන්වීමකි.' විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි)

2. (i) බ්‍රාහ්මණ සමාජය තුළ කාන්තාවට නිසි තැන හිමි නො වුණු බව සනාථ කිරීමට කරුණු හතරක් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)
(ii) බුදුසමය තුළ කාන්තාවට නිසි තැන ලබා දුන් බවට සාධක හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)
(iii) භික්ෂුණී සමාජය තුළ කාන්තාව ලැබූ සැනසීම තෙරණී චරිත දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)
(iv) නූතන සමාජයෙහි කාන්තා හිංසනය පිටුදැකීමෙහි ලා ගත හැකි ක්‍රියාමාර්ග බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) බුද්ධකාලීන භාරතයේ ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ නිගණ්ඨ සාධුවරයන් හඳුන්වන දෙයාකාරය හා එසේ හැඳින්වීමට හේතු පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)
(ii) නිගණ්ඨ සාධුවරයන් අත්තකිලමථානුයෝගයෙහි යෙදෙමින් අනුගමනය කළ විවිධ ව්‍රතචර්යා අතුරින් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)
(iii) නිගණ්ඨනාතපුත්ත ශාස්තෘතුමාගේ 'චතුයාම සංවර ශීලය' ලියා දක්වා, කේවලත්වය නම් විමුක්ති සුවය ලැබීමට එම ඉගැන්වීම හේතු වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)
(iv) අත්තකිලමථානුයෝගය නිර්වාණයට මග නො වේ යැයි බැහැර කළ සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ අනුගමනය කළ ධර්ම මාර්ගය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

### II කොටස

4. (i) සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, නම් තැබීම, වප්මඟුල් උත්සවය, විවාහය හා ශිල්ප දැක්වීම යන අවස්ථාවල වැදගත් සිදුවීම් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)
(ii) සිදුහත් බෝසත් චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ හතරක් දක්වන්න. (ලකුණු 04 යි)
(iii) සතර පෙරනිමිතිවලින් පෙන්නුම් කෙරෙන ජීවිත යථාර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(iv) සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සත්‍යාවබෝධය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

TO BE ... IN THE WEBSITE OF DOE



**5.** (i) බුදුසසුනෙහි ප්‍රථම ද්වේවාචික උපාසකවරුන් නම් කොට, ඔවුන් එසේ හැඳින්වීමට හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(ii) බුදුසසුනෙහි පළමු රහතන් වහන්සේලා අතුරින් සිවුදෙනෙකු නම් කොට, උන් වහන්සේලා රහත්භාවය ලැබීමට ශ්‍රවණය කළ සූත්‍ර දේශනා නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පස්වග තාපසවරුන් සොයා ඉසිපතනයට වැඩම කරන බුදුරජාණන් වහන්සේ හා අතරමග මුණගැසුණු උපක ආජීවක අතර ඇතිවූ සංවාදය ලියා දක්වන්න. (ලකුණු 06 යි)

(iv) බුදුරදුන් විසින් සිදු කළ පළමු ධර්ම දේශනයේ ඇතුළත් ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට අනුව බෙදා දක්වමින්, ශීලය ආර්ය මාර්ගයේ පදනම වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) 'දකුණු බිහාරය' නමින් හැඳින්වෙන රාජාණ්ඩු අතුරින් පළමුවැන්නට උතුර, නැගෙනහිර, බටහිර හා නිරිතදිග දේශසීමා ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(ii) බුදුසසුනේ ප්‍රථම ආරාම පූජාව, එය සිදු කළ රජතුමා, පාලන රාජධානිය හා එහි අගනගරය ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බුදුසසුනේ ප්‍රථම ආරාම පූජාව සිදු කළ රජතුමා එදින රාත්‍රියේ හඬා වැලපෙන තිරුවත් ප්‍රේතයන් සිහිනෙන් දැකීමට හේතු හා ඔවුන් සුවපත් කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) බුදුසසුනෙහි දානය, දායක පක්ෂයෙහි චිත්තපාරිශුද්ධිය සඳහා හේතු වන ආකාරය කුසල මූල සංකල්පයට අනුව සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

**7.** (i) බුදුරජාණන් වහන්සේ වස් විසූ ස්ථාන හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුරදුන් දවස ආරාම කරවා සසුනට පූජා කළ සිටුවරුන් හතරදෙනෙකු, ඔවුන් කරවූ ආරාමවල නම් සමග ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බුදුසසුනේ ශීඝ්‍ර ව්‍යාප්තිය උදෙසා සුදත්ත සිටුවරයාගේ ශාසනික සේවාව ඉවහල් වූ අයුරු විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) සිවුවනක් පිරිසෙහි උපාසක-උපාසිකා දෙපිරිසට අයත් ශාසනික කාර්යභාරය වන්නේ භික්ෂු, භික්ෂුණී උභය සංඝයා උදෙසා සිවුපසයෙන් ඇප උපස්ථාන කිරීම පමණක් දැයි විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි)

**8.** (i) බුදුරජාණන් වහන්සේ අවසන් ජීවන චාරිකාවේ දී වැඩම කළ ස්ථාන හතරක් හා ඒ ඒ ස්ථානවල දී හමු වූවන් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(ii) බුදුරජාණන් වහන්සේගේ ආදාහන පූජෝත්සවයෙන් පසු ධාතූන් වහන්සේලා බෙදා ගැනීමට අරගල කළ රාජදූතයන් සිවුදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) බුදුරජාණන් වහන්සේ තම ජීවිතයේ අවසන් දින කිහිපය ගත කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) බුදුරජාණන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය ලියා දක්වා, ඉන් ලෝකයා වෙත සපයන ආදර්ශය සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**9.** (i) බුදුසසුනෙහි සිවුවනක් පිරිසෙහි අගතනතුරු ලැබූ ශ්‍රාවක-ශ්‍රාවිකාවන් සිවුදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුරදුන් එම ශ්‍රාවක-ශ්‍රාවිකාවන් වෙත ප්‍රදානය කළ අගතනතුරු පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(iii) සැරියුත් - මුගලන් අගසව් දෙදෙනා වහන්සේගේ ශාසනික සේවාව කෙටියෙන් අගයන්න. (ලකුණු 06 යි)

(iv) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ හා ආනන්ද මහරහතන් වහන්සේ සද්ධර්මයේ චිර පැවැත්ම උදෙසා අනුගමනය කළ ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**10.** (i) බුදුසසුනෙහි උන්නතියට දායක වූ බුද්ධකාලීන උපාසක-උපාසිකාවන් සිවුදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) ධනංජය සිටුතුමා පතිකුලයට යන විශාඛා දියණියට ලබා දුන් අවවාදවල ඇතුළත් කරුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) විශාඛා මහා උපාසිකාවගේ ශාසනික දායකත්වය කෙටියෙන් අගයන්න. (ලකුණු 06 යි)

(iv) බුදුසසුනේ චිර පැවැත්ම උදෙසා වර්තමාන උපාසක-උපාසිකාවන් සතු යුතුකම් හා වගකීම් විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි)

* * *

Department of Examinations, Sri Lanka

127706

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2562 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018(2019) 2S

## (02) බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

පැ තුනයි

2019.03.16 /12.50 - 16.00

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. (i) හේතුඵල සිද්ධාන්තය මුල්කර ගනිමින් ප්‍රථමයෙන් ධර්මය දේශනා කළ රහතන් වහන්සේ හා ඒ ධර්මය අවබෝධ කර ගත්තේ කවුරුන් දැයි දක්වන්න. *(ලකුණු 02 යි)*

   (ii) ඉහත (i) හි සිදුවීමට අදාළ තොරතුරු සඳහන් වන විනය ග්‍රන්ථයත් එම ධර්මය නොදැනීම නිසා සසර සැරිසැරීමට හේතුව දැක්වෙන දීඝනිකායාගත සූත්‍රයත් නම් කරන්න. *(ලකුණු 04 යි)*

   (iii) හේතුඵල ධර්මතාව ලොව සදහට ම පවත්නා සත්‍යය බව දේශනා කිරීමට හේතු වූ කරුණු කෙටියෙන් ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

   (iv) සත්ත්වයා සසර සැරිසැරීමට හෙවත් පුනර්භවයක් ලැබීමට හේතුව ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්ම විග්‍රහය මගින් පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

2. (i) චතුරාර්ය සත්‍ය ධර්ම නම් කරන්න. *(ලකුණු 02 යි)*

   (ii) ඒවා ආර්ය සත්‍ය නාමයෙන් විශේෂ කොට දැක්වීමේ හේතුව පහදා දෙන්න. *(ලකුණු 04 යි)*

   (iii) සිවුවන ආර්ය සත්‍ය 'මජ්ඣිමා පටිපදා' නාමයෙන් හඳුන්වා දීමේ වැදගත්කම පෙන්වා දී, එම ප්‍රතිපදාවට අයත් අංග අනුපිළිවෙළින් දක්වන්න. *(ලකුණු 06 යි)*

   (iv) බෞද්ධ විමුක්ති මාර්ගයට අයත් පියවර තුන දක්වා, එම පියවරවලින් අපේක්ෂිත කාර්ය පෙන්වා දී, එහි පළමු පියවර අනුගමනය නො කිරීම වත්මන් සමාජ සංස්ථාව බිඳ වැටීමට හේතු වන ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

3. (i) නිර්වාණ මාර්ගයේ දී විශේෂයෙන් අවබෝධ කර ගත යුතු ලක්ෂණත්‍රය නම් කරන්න. *(ලකුණු 02 යි)*

   (ii) ඒවායින් දෙකක ස්වභාවය හඳුන්වා දෙන්න. *(ලකුණු 04 යි)*

   (iii) මෙම ලක්ෂණත්‍රයට අයත් භාවනා මාර්ගය හඳුන්වන නම ලියා, එය බෞද්ධ භාවනාවක් ලෙසින් දක්වා ඇත්තේ කවර හේතු නිසා දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

   (iv) සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථා ස්වභාවය අවබෝධ කර ගැනීමට මේ ලක්ෂණ හේතු වන අයුරු දක්වන්න. *(ලකුණු 08 යි)*

4. (i) බුදු දහම 'කර්මය' යනුවෙන් හඳුන්වන චෛතසිකයේ නම හා එම චෛතසිකය මුල්කර ගෙන කාර්ය සිදු කරන ද්වාරත්‍රය නම් කරන්න. *(ලකුණු 02 යි)*

   (ii) සචේතනික හා අචේතනික ක්‍රියා කවරේ දැයි උදාහරණ මගින් පෙන්වා දෙන්න. *(ලකුණු 04 යි)*

   (iii) ද්වාරත්‍රය මුල්කර ගෙන කරන ක්‍රියා දක්වා, ඒවා කවර නම් මිනුම් දඬු මුල්කර ගෙන හිතකර, අහිතකර ලෙසින් තෝරා ඇත් දැයි දක්වන්න. *(ලකුණු 06 යි)*

   (iv) විපාක දෙන කාල අනුව කර්මයේ ප්‍රභේද දක්වා, කෙලෙස් නැසූ උතුමන්ට පවා යහපත්, අයහපත් කර්ම විපාකවලට මුහුණදීමට සිදු වූ ආකාරය නිදසුන් මගින් ගෙනහැර දක්වන්න. *(ලකුණු 08 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

## II කොටස

**5.** (i) සමථ භාවනාව සඳහා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ උපයෝගි වන අංග දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ධර්මාර්ථ පැහැදිලි වන සේ එම අංග දෙක හඳුන්වන්න. *(ලකුණු 04 යි)*

(iii) භාවනාලාභී පුද්ගලයා විසින් ප්‍රථමයෙන් ඇති කර ගත යුතු සංවරය දක්වා, දෙවනුව ඔහු චිත්ත සංවරය සඳහා යොමු විය යුතු ආකාරය පහදා දෙන්න. *(ලකුණු 06 යි)*

(iv) සමථ භාවනාව සඳහා අරමුණු වන කර්මස්ථාන හතළිහ ලියා, ආනාපානසති භාවනාව වැඩීමෙන් ලැබිය හැකි යහපත පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

**6.** (i) සතර පරමාර්ථ ධර්ම නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) එම පරමාර්ථ ධර්මවලට අයත් සංඛ්‍යා දක්වා, යහපත්, අයහපත් ක්‍රියා හඳුන්වන සිත් වර්ග දෙක ඉදිරිපත් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) මෝහ මූලික සිත් නම් කර, එම සිත්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ සමග ඒවා කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iv) මාර්ග ඥාන වශයෙන් පෙන්වා දී ඇති සිත් නම් කර, හතරවන මාර්ග ඥානයෙන් ප්‍රහීණ කරන සංයෝජන ධර්ම පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

## III කොටස

**7.** පහත සඳහන් පාලි ගාථා සිංහලට නගන්න.

(i) පහූත භක්ඛෝ භවති - විප්පවුත්ථෝ සකා ඝරා
බහූනං උපජීවන්ති - යෝ මිත්තානං න දූභති.

(ii) නාස්ස චෝරා පසහන්ති - නාතිමඤ්ඤේති ඛත්තියෝ
සබ්බේ අමිත්තේ තරතී - යෝ මිත්තානං න දූභති.

(iii) අක්කුද්ධෝ සඝරං එති - සභාය පටිනන්දිතෝ
ඤාතිනං උත්තමෝ හෝති - යෝ මිත්තානං න දූභති.

(iv) සබ්බේ සත්තා සබ්බේ පාණා - සබ්බේ භූතා ච කේවලා
සබ්බේ භද්‍රානි පස්සන්තු - මා කඤ්චි පාපමාගමා.

(v) අපාදකේහි මේ මෙත්තං - මෙත්තං දිපාදකේහි මේ
චතුප්පදේහි මේ මෙත්තං - මෙත්තං බහුප්පදේහි මේ.

*(ලකුණු 04 × 5 = 20 යි)*

**8.** පහත දැක්වෙන පාලි වාක්‍ය සිංහලට නගන්න.

(i) ඉදමවෝච භගවා අත්තමනා තේ භික්ඛු භගවතෝ භාසිතං අභිනන්දුන්ති.

(ii) අථ ඛෝ සම්බහුලා භික්ඛු යේන භගවා තේනුපසංකමිංසු, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදිංසු.

(iii) තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි "භික්ඛවො'ති" "භදන්තෙ"ති තේ භික්ඛූ භගවතෝ පච්චස්සෝසුං.

(iv) ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකො එහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති.

*(ලකුණු 05 × 4 = 20 යි)*

* * *

Department of Examinations, Sri Lanka

125352

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE ... IN THE ... OF DOE

Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2562 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018(2019) **3S**

## (03) ශාසන ඉතිහාසය

පැ තුනයි

**2019.03.17 /08.30 - 11.40**

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) බුද්ධ ශාසනය ආරම්භ වන සමයේ භාරතයේ පැවති සොළොස් මහා ජනපද නම් කර, ඒ අතුරින් රාජාණ්ඩු පැවති ජනපද දෙකක් හා සමූහාණ්ඩු පැවති ජනපද එකක් නම් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බුදුරදුන් ප්‍රශ්න විසඳීමට භාවිත කළ ක්‍රම හතරක් නම් කර, ඒවා කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "බුදුහිමියන් ඉදිරිපත් කළ දර්ශනය, බුදු දහමින් සමාජ ගැටලුවලට අර්ථවත් විසඳුම් ලැබීම, සුසංවිධිත ධර්මදූත සේවාව, රාජානුග්‍රහය, ප්‍රසාදයට පත් උපාසක උපාසිකාවන්ගේ අනුග්‍රහය යන කරුණු සම්බුද්ධ ශාසන ව්‍යාප්තියට පදනම් විය."
මෙම ප්‍රකාශය අදාළ කරුණු දක්වමින් තහවුරු කරන්න. *(ලකුණු 08 යි)*

**2.** (i) ප්‍රථමයෙන් බුද්ධ ශාසනයට පිවිසි ප්‍රව්‍රජිත ශ්‍රාවක පිරිස නම් කර, එම පිරිස අර්හත්වයට පත්වූයේ කවර සූත්‍ර ධර්මයක් ශ්‍රවණය කිරීමෙන් දැයි දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) 'ඒහි භික්ඛු මහණ උපසම්පදාව' යනු කුමක් දැයි හඳුන්වා, භික්ෂු ශාසනය තුළ සරණාගමන පැවිද්ද ඇතිවීමට හේතු දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) විනය නීති පැනවීමේ අරමුණු හා ඒවා සංඝ සමාජයේ පැවැත්මට උපකාර වූ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

**3.** (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට මුල් වූ හේතු කවරේ දැයි පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) දෙවන ධර්ම සංගායනාවෙහි ප්‍රතිඵල සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "ප්‍රථම ධර්ම සංගායනාවේ අරමුණ වූයේ විසිරී පැවති ධර්ම විනය ඒකරාශි කොට වෙනස්කම්වලට භාජනය වීමට ඉඩ නො දී සුරැකි ව තැබීම යි."
මෙම ප්‍රකාශය තහවුරු කරන්න. *(ලකුණු 08 යි)*

**4.** (i) සැදැහැවත් කුල පුත්‍රයන් විසින් වැඳ පුදා සංවේග උපදවා ගත යුතු යැයි බුදුරදුන් විසින් අනුදැන වදාරණ ලද ස්ථාන හතර නම් කර, එම ස්ථාන අශෝක රජතුමන් විසින් වැඳ පුදා ගන්නා ලද බවට දැක්වෙන සාධක ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) අශෝක රජතුමා සිය රාජ්‍යය තුළ බුදුසසුන දියුණු කිරීමට කළ කටයුතු හයක් නම් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බෞද්ධ ධර්මය පදනම් කරගත් පාලන ව්‍යූහයක් තුළින් ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට ධර්මාශෝක රජතුමා ක්‍රියා කළ ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

[ දෙවන පිටුව බලන්න.

TO BE PRINTED IN THE WEBSITE OF DOE

## II කොටස

**5.** (i) බුදුරදුන් ලක්දිවට වැඩම කළ අවස්ථා නම් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) එම අවස්ථාවල සිදු වූ ශාසනික සිදුවීම් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස මහින්දාගමනයෙන් පසු නව මඟකට යොමු වූ අයුරු පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

**6.** (i) සංඝමිත්තා තෙරණිය වෙතින් පැවිද්ද හා උපසම්පදාව ලත් භික්ෂුණීන් වහන්සේලා හය දෙනෙකු නම් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ලක්දිව භික්ෂුණී ශාසනය පිරිහීමට හේතු වූ කරුණු දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) පරාධීන තත්ත්වයක පසු වූ කාන්තාව බුදුසමයෙන් ඉමහත් සහනයක් ලැබූ අයුරු විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

**7.** (i) ධර්මාශෝක රජතුමා විසින් බෝධීන් වහන්සේ සමඟ එවන ලද පිරිස අතර සිටි අය අයත් වූ විවිධ කුල අතුරින් හයක් නම් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ලක්දිව රජවරුන් විසින් බෝධීන් වහන්සේ උදෙසා පවත්වන ලද උත්සව තුනක් සහ එම රජවරුන්ගේ නම් ද දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) මහා බෝධිය වටා ගෙතුණු 'බෝධි සාහිත්‍යය' පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් ඉදිරිපත් කරන්න. *(ලකුණු 08 යි)*

**8.** පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.

(i) මගධ ජනපදය

(ii) අනේපිඬු සිටුතුමා

(iii) වළගම්බා රජතුමා

(iv) සිරි දන්ත ධාතූන් වහන්සේ

(v) ථූපාරාම දාගැබ

(vi) අශෝක සෙල්ලිපි

(vii) සිවුවැනි ධර්ම සංගායනාව

(viii) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය

*(ලකුණු 05 × 4 = 20 යි)*

* * *

Department of Examinations, Sri Lanka

126943

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

TO BE ... IN THE ... DOE

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2562 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018(2019) 4S

## (04) බෞද්ධ සංස්කෘතිය

පැ. තුනයි

2019.03.17 /12.50 - 16.00

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් හතරකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න එකක් වත් ඇතුළත් වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

**1.** (i) බෞද්ධ භික්ෂූන් වහන්සේගේ වස් විසීමේ චාරිත්‍රය ආරම්භ වීමට හේතු වූ කරුණු විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ගිහි-පැවිදි සම්බන්ධය වර්ධනය කිරීම සඳහා වස් කාලය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) කඨින චීවරය හඳුන්වා, එය සකස් කිරීමේ දී අනුගමනය කෙරෙන චාරිත්‍ර විධි විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

**2.** (i) ගිහි-පැවිදි දෙපක්ෂයට ම වැදගත් වන චාරිත්‍රයක් වශයෙන් ගිලානෝපස්ථානය හඳුන්වා දීමට බුදුරදුන් අනුදැන වදාළ හේතු සාධක පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) ගිලානෝපස්ථානයේ දී උපස්ථානයට යෝග්‍ය ගිලනා හා උපස්ථායකයා සතු ව තිබිය යුතු ගුණාංග විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ගිලානෝපස්ථාන සේවයෙහි යෙදුණු පැරණි ශ්‍රී ලාංකික බෞද්ධ රජවරුන් ගැන විමර්ශනයක් කරන්න. *(ලකුණු 08 යි)*

**3.** (i) පෙරහැර යනු කුමක් දැයි හඳුන්වා, පෙරහැරක තිබිය යුතු මූලික අංගෝපාංග කවරේ දැයි පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) ලක්දිව දළදා පෙරහැරේ ආරම්භය හා වර්ධනය පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බෞද්ධ උත්සවයක් මෙන් ම සංස්කෘතික සන්දර්ශනයක් වශයෙන් ද මහනුවර ඇසළ පෙරහැරෙහි පවත්නා වැදගත්කම පහදන්න. *(ලකුණු 08 යි)*

### II කොටස

**4.** (i) බුදුරදුන් ජීවමාන ව වැඩසිටිය දී ම ස්තූප නිර්මාණය ආරම්භ වූ බව තහවුරු කළ හැකි සාධක ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) උපෝසථාගාර යනු කුමක් දැයි හඳුන්වා, පැරණි උපෝසථාගාර දෙකක් පිළිබඳ විස්තර සපයන්න. *(ලකුණු 06 යි)*

(iii) අනුරාධපුරයේ දක්නට ලැබෙන විශාල චෛත්‍ය හඳුන්වා, ඒවා ඉදි කළ නරපතියන් පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 08 යි)*

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



**5.** (i) බෝධිඝරය හඳුන්වා, දැනට ශ්‍රී ලංකාවේ අවශිෂ්ට ව පවත්නා පැරණි බෝධිඝරයක් පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) පොළොන්නරුවේ අටදාගෙය හා හැටදාගෙය හඳුන්වා, ඒවා තැන වූ රජවරුන් හා ඔවුන්ගේ අරමුණු පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) හිටිපිළිම යනු කවරේ දැයි හඳුන්වා, ඔබට අභිමත ශ්‍රී ලාංකේය පැරණි හිටිපිළිම දෙකක් පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

## III කොටස

**6.** (i) නව අරහාදි බුදුගුණ මුල් කොට ගෙන පැරණි ගද්‍ය ග්‍රන්ථ ලියූ කතුවරුන් හා ඔවුන්ගේ කෘතීන්හි අන්තර්ගත බුදුගුණ පිළිබඳ ව විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) තෙරුවන් ගුණ පාදක කොට රචිත පැරණි ගද්‍ය කාව්‍ය තුන හඳුන්වා, ඒවායේ කතුවරයා ද නම් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ජාතක කථා රචනයේ දී අනුගමනය කළ මූලික ආකෘතියෙහි අන්තර්ගත කොටස් සනිදර්ශන ව පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

**7.** (i) 'කව්සිළුමිණ' හා 'කාව්‍යශෙඛර' යන කාව්‍ය සඳහා පාදක කොට ගත් ජාතක කථා නම් කොට, මේ කාව්‍යයන්හි නිරූපිත කාන්තා චරිතවල ස්වභාවය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ගුත්තිල කාව්‍යය, දහම්සොඬ කාව්‍යය හා සඳකිඳුරු දා කව ලියූ කතුවරුන් නම් කර, ඒවායේ වස්තු විෂය කෙටියෙන් සඳහන් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පොදු පාඨක ජනතාව අතර තුන්සරණය ජනප්‍රිය වීමට හේතු වූ සාධක කවරේ දැයි පිරික්සන්න. *(ලකුණු 08 යි)*

## IV කොටස

**8.** (i) දහඅට වන සියවසේ මියන්මාර (බුරුම) භික්ෂූන් අතර මතභේදයට පාත්‍ර වූ පාරුපණ වාදය කුමක් දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(ii) දහනව වන සියවසේ දී ලක්දිව අමරපුර නිකාය පිහිටුවීමට හේතු වූ කරුණු දක්වා, ඒ සඳහා මූලික වූ ගිහි-පැවිදි පිරිස ගැන විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මියන්මාරයේ (බුරුමයේ) පවත්වන ලද පංචම හා ෂට්ඨ යන සංගායනා ගැන සමාලෝචනයක් කරන්න. *(ලකුණු 08 යි)*

**9.** (i) තායි බෞද්ධයන් පැවිදි ජීවිතයට ඇතුළත් වීම කෙරෙහි බලපාන විවිධ හේතු කවරේ දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(ii) තායිලන්තයේ බුදුදහම හා රජය අතර පවත්නා සමීප සබඳතාවේ ස්වරූපය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) චීනයට බුදුදහම හඳුන්වා දීම ආශ්‍රිත ව පවත්නා මතවාද විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

* * *

Department of Examinations, Sri Lanka